| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| 10 **ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව** - II |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

★ **මෙහි පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.**

★ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**

01)(අ)

i. තේමා සිතියමක් යනු කුමක්ද? (ල 2)

ii. 1:50 000 භූ ලක්ෂණ සිතියමක වට තීරුවේ ඉහළ කොටසේ දක්නට ලැබෙන තොරතුරු දෙකක් ලියන්න. (ල 2)

iii. 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන දිශා සටහන ඇඳ දක්වන්න. (ල 2)

iv. උචිත සංකේත හා වර්ණ භාවිතයෙන් පහත දැක්වෙන ලක්ෂණ ඇඳ දක්වන්න.

- i. උප දිසාපති කොට්ඨාශ මායිම
- ii. පොලීසිය
- iii. අඩිපාර
- iv. තේ වගාව

(ල 4)

(ආ) මෙහි දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. සිතියමේ A B C වශයෙන් දක්වා ඇති කඳු අතරින් අල්තායි කඳු දැක්වෙන අක්ෂරය කුමක්ද?

ii. D අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න.

iii. E F G අක්ෂර අතරින් නයිජර් ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද?

iv. H J K අක්ෂර අතරින් නැගෙනහිර දේශාංශ 80° දැක්වෙන අක්ෂරය කුමක්ද?

v. L M N අක්ෂර අතරින් සයිබීරියානු තැන්න දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ල 5)

(ඉ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A B C අක්ෂර අතරින් බතලගොඩ වී පර්යේෂණ ආයතනය පිහිටි අක්ෂරය කුමක්ද?

ii. D E F අක්ෂර අතරින් උඩරට තේ වගා කරන නුවරඑළිය දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද?

iii. G H J අක්ෂර අතරින් සුළු පොල් ත්‍රිකෝණයට අයත් නගරයක් වන මිද්දෙණිය දක්වා ඇති අක්ෂරය කුමක්ද?

iv. මොනරාගල දිස්ත්‍රික්කය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

v. L M N අක්ෂර අතරින් දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා එළවළු වගා කරන යාපනය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ල 5)

02)

i. වායුගෝලයේ අංශු මාත්‍ර වශයෙන් ඇති වායු වර්ග දෙකක් නම් කරන්න. (ල 2)

ii. අපරිවර්තී ගෝලයේ විශේෂ ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල 3)

iii. වායු දූෂණය අවම කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

03)

i. පහත රටවල් පිහිටා ඇති භූ තැටි නම් කරන්න. (ල 2)

a) මැඩගස්කරය

b) බ්‍රසීලය

ii. පෘථිවි කබොලෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල 3)

iii. මිනිස් ක්‍රියාකාරකම් නිසා ශිලා ගෝලයට සිදුවන අහිතකර බලපෑම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

04)

i. තේ වගාවට අවශ්‍ය භෞතික සාධක දෙකක් ලියන්න. (ල 2)

ii. ලෝකයේ තේ වගාවේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල 3)

iii. තේ නිෂ්පාදනය කරන රටවල් තේ අලෙවිය වැඩි කර ගැනීමට අනුගමනය කරන උපාය මාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

05)

i. ලෝකයේ විශාල වශයෙන් කිරිපට්ටි පාලනය හා සම්බන්ධ රටවල් දෙකක් සිතියමේ A හා B ලෙස දැක්වේ. ඒවා අනුපිළිවෙළින් නම් කරන්න. (ල 2)




ii. කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල 3)

iii. කිරිපට්ටි පාලනයේ දියුණුව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල 5)

06)

i. ශ්‍රී ලංකාවේ වී වගා කරන අතරමැදි කලාපයට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ වී වගාවට බලපා ඇති භෞතික සාධක තුනක් ලියන්න. (ල 3)

iii. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වී ගොවින් මුහුණපාන ගැටළු තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල 5)

07)

i. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික මට්ටමින් එළවළු වගාව සිදුකරන ප්‍රදේශ දෙකක් ලියන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව දියුණු කිරීමට රජය මඟින් පිහිටුවා ඇති ආයතන තුනක් නම් කරන්න. (ල 3)

iii. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව දියුණු කිරීම තුළින් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

08)

i. ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සඳහා බලපා ඇති හිතකර සාධක තුනක් ලියා දක්වන්න. (ල 3)

iii. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා රජයෙන් ගෙන ඇති පියවරයන් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)